**තුරුසවිය අරමුදල - 2022**
**------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

තුරුසවිය අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2000 අංක 23 දරන තුරුසවිය අරමුදල පනතේ , 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ගිණුම්කරණ අඩුපාඩු**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| අරමුදල වෙත පරිත්‍යාග වශයෙන් 2018 වර්ෂයේදී වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයෙන් ලැබුණු ලී බඩු උපකරණ ඒකක 89ක අගය තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් කර නොතිබුණි. | ආයතනයේ පරීක්ෂණ ලේඛනයේ සටහන් පවත්වාගෙන යන අතර මෙම භාණ්ඩවල අගය තක්සේරු කිරීමට අවශ්‍ය කටයුතු කරනු ඇත. | පරිත්‍යාග ලෙස ලැබුණු වත්කම්වල අගය තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් කළ යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| තුරුසවිය අරමුදල මගින් කළුතර, කෑගල්ල, රත්නපුර සහ ගම්පහ යන දිස්ත්‍රික්ක 04 හි තුරුසවිය සමිති 31 ක් සඳහා ලබාදී ඇති අත්තිකාරම් සහ ණය මුදල්වලින් වර්ෂ 05කට වැඩි කාලයක සිට ලැබිය යුතු එකතුව රු.826,109 ක ශේෂයක් අයකර ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් හතර වතාවක් පමණ එන්තරවාසි හා නෛතික දැනුවත් කිරීම් කරඇති අතර, එම මුදලින් වැඩිමනත්ව ප්‍රමාණය අය කර ගැනීමට හැකියාව උදාවුවත්, ශේෂගත මුදල මේ දක්වා අයකර ගැනීමට නොහැකි වී ඇත. ඒ අනුව නැවත වාරයක් ඒ සම්බන්ධයෙන් උත්සහ දැරීමට හෝ බොල්ණය ලෙස කපා හැරීමට කළමනාකරණ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | අත්තිකාරම් සහ ණය මුදල් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9.1 ඡේදය | අතුරු අග්‍රිමයන් එය දෙන ලද කාර්යයන් නිම කර දින 10ක් ඇතුළත පියවිය යුතු වුවද, ආයතනය විසින් 2022 වර්ෂයේදී ලබා දී තිබුණු එකතුව රු.174,530ක් වටිනා තත්කාර්යය අතුරු අග්‍රිම 12ක් පියවීම සඳහා දින 14ත්, දින 271ත් අතර කාලයක් ප්‍රමාද වී තිබුණු අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය. | 2022.12.31 දින වන විට සියලුම අතුරු අග්‍රිමයන් ප්‍රතිපූර්ණය කර ගිණුම් සකසා ඇත. ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට කටයුතු කරනු ඇත. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව නියමිත කාලය තුළදී අත්තිකාරම් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 හි 3.3 ඡේදය | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | 30/2016 චක්‍රලේඛය අනුව මාස 06 කට වරක් ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂා කර නැත. මීට වසරකට පෙර ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාව කර ඇත. ඉදිරියේදී මාස 06 කට වරක් ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් කිරිමට කටයුතු කරනු ඇත. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය අංක 1645(අ) | සෑම වාහනයක් සඳහාම ක්‍රමවත් හා විධිමත් ලෙස සම්පූර්ණ කර වාහන ලොග් සටහන් පොත් පවත්වාගෙන යා යුතු වුවත් අරමුදලේ භාවිතා කරන වාහන තුනකට අදාළව ලොග් පොත් පවත්වාගෙන ගොස් නොතිබුණි. එසේම පවත්වාගෙන ගොස් තිබුණු ලොග් පොත්වලද වාහන පිළිබඳ විස්තර, ඉන්ධන දහනය, අලුත්වැඩියාවන් පිළිබඳ විස්තර ඇතුළත් කර නිසි පරිදි සම්පූර්ණ කර නොතිබුණි. | දැනට ධාවන තත්වයේ පවතින වාහන සඳහා පමණක් ලොග් සටහන් පොත් පවත්වා ගෙන යනු ලබන අතර, ලොග් සටහන් පොත් වල අඩුපාඩු සම්පූර්ණ කිරිමට කටයුතු කරනු ඇත. | මු.රෙ. විධිවිධානවලට අනුකූලව වාහන ලොග් සටහන් පොත් පවත්වාගෙන යා යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,978,820ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,543,063ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.7,521,883ක පිරිහීමක් නිරීක්ෂණය විය.මෙම පිරිහීමට භාණ්ඩාගාර හා අනෙකුත් ප්‍රදාන රු.34,245,166 කින් අඩුවීම සහ වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ රු.4,943,207 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතය 14 :1ක් හා 13:1 වූ අතර පසුගිය වර්ෂයේ දී එම අනුපාතයන් පිලිවෙලින් 27:1 ක් හා 26:1 ක් විය. 2022 හා 2021 වර්ෂයන්හි අරමුදල් ඵලදායී දිගුකාලීන ආයෝජනයක යෙදවීම වෙනුවට මුදල් හා මුදල් සමාන දෑ ලෙස පිලිවෙලින් රු.22,340,522ක් හා රු.21,865,251ක් පවත්වාගෙන යාම තුලින් ජංගම හා ක්ෂණික වත්කම් අනුපාත විශාල අගයන් ගෙන තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තුරුසවිය අරමුදල යටතේ දිස්ත්‍රික්ක 13 ක තුරුසවිය සමිති 818ක් ලියාපදිංචි කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසානයට සමිති 293ක් අක්‍රීය තත්ත්වයේ පැවතුණි. | පසුගිය වර්ෂ කිහිපය පුරාම ඇතැම් ප්‍රදේශ වල රබර් වගාව ඉවත් කරමින් වෙනත් බෝග වෙත යොමු වීම , නාගරීකරණය නිසා රබර් ඉඩම් ගලවා දැමීම වැනි හේතු නිසා ඇතැම් සමිති වල සාමාජිකයින්ගේ ප්‍රමාණය අඩුවීම සමග එම සමිති වල ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් ගැටලු පැන නැගී ඇත. එහෙත් ඉදිරියේදී එසේ පවතින සමිති ප්‍රතිසංවිධානය සිදු කර ඒකාබද්ධ කරමින් ක්‍රියාකාරි කිරිමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත. | අක්‍රීය සමිති සක්‍රීය කිරීම තුළින් අරමුදලේ ක්‍රියාකාරිත්වය ඉහළ නැංවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020 වර්ෂයේ දී ජනාධිපති ලේකම් කාර්යාලයෙන් අරමුදල වෙත ලැබුණු ජීප් රථයක් අලුත්වැඩියාව සඳහා 2021 නොවැම්බර් මාසයේ ගරාජයකට බාර දී තිබුණු නමුත් 2023 මැයි මාසය දක්වා රථයේ අලුත්වැඩියා කටයුතු නිමකර කාර්යාලයට රැගෙනවිත් නොතිබුණි. | අලුත්වැඩියාව නිම කර ඇතත් අලුත්වැඩියාව වෙනුවෙන් මුදල් නොගෙවීම මත රථය මාතර ගරාජයේ රදවා ඇති හෙයින් පොලිසියේ පැමිණිල්ලක් මේ සම්බන්ධයෙන් ගොනු කර ඇති අතර, කඩිනමින් රථය ආයතනය වෙත ලබා ගැනීමට කටයුතු කරනු ඇත. | නොපමාව වාහනය ආපසු ලබාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2020 ජනවාරි 05 දින ජනාධිපති ලේකම් කාර්යාලයෙන් තුරුසවිය අරමුදල වෙත ලැබී තිබුණු කාර් රථය රැගෙන ආ දිනයේ සිට ධාවන තත්ත්වයේ නොතිබුණු අතර වාහන අලුත්වැඩියාව සඳහා ප්‍රමාණවත් මුදලක් වෙන්කර නොමැති බැවින් අලුත්වැඩියා කිරීමට කටයුතු නොකර වසර තුනකට වැඩි කාලයක් තුරුසවිය අරමුදල පරිශ්‍රයේ ගාල්කර තිබුණි. | අදාළ වාහනය අලුත්වැඩියා කිරිම සඳහා ප්‍රමාණවත් මුදලක් වෙන්කර නොතිබු බැවින් එය අලුත්වැඩියා කිරිමට නොහැකිව ඇත. | වාහනය අලුත්වැඩියා කර උපයෝජනය කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළදී රු.3,000,000ක ඇස්තමේන්තු වටිනාකමක් සහිත ඉහළ ඵලදායිතාවයෙන් හා කාර්යක්ෂමතාවයෙන් යුතු දුම් ගෙවල් 20ක් ඉදිකිරීමට ඉලක්ක කර තිබුණු නමුත් වර්ෂය අවසාන වන විට තුරුසවිය සමිති විසින් දුම් ගෙවල් 12ක් පමණක් ඉදිකර තිබුණි. | මුල්‍ය ප්‍රතිපාදන නොලැබීම නිසා නවීන දුම්කාමර සියල්ල ඉදිකර අවසන් කිරිමට නොහැකි විය. එසේම 2022 වර්ෂයේදී රට තුළ පැවති ඉන්ධන අර්බුදය, ආර්ථික අර්බුදය යන සියලු කරුණු මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය කෙරෙහි ඍජු බලපෑමක් සිදු කරන ලදි. එසේ වුවත්, සියලු අභියෝග හමුවේ වුවද, නවීන දුම් කාමර 12 ක් ඉදි කිරිමේ කටයුතු අවසන් කර ඇත. | සැලසුම් කළ ඉතිරි දුම් ගෙවල් 8 නොපමාව ඉදිකළ යුතුය. |
| (ඉ) | 2021 වර්ෂයේ දී තුරුසවිය සමිති සාමාජිකයින් වෙත සියයට 50ක සහනාධාරයක් මත බෙදාදීමට කිරිපිහි 4000ක් මිලදී ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී තුරුසවිය සමිති වෙත පිහි 1,740ක් පමණක් බෙදා හැර තිබුණු අතර, පිහි 150ක් 2023 වර්ෂයේ පුහුණු වැඩසටහන් සඳහා ද නිකුත් කිරීමෙන් පසුව තොග පොතට අනුව 2023 පෙබරවාරි 01 දිනට කිරිපිහි ශේෂය 2,110 ක් වුවද , එදින භෞතික විගණන පරීක්ෂාවේදී රු.1,680,705ක කිරිපිහි 1,989ක් පමණක් ඉතිරිවී තිබුණි. එම කිරි පිහි ප්‍රමාණය ද උඩුමහලේ එළිමහන් කොටසේ භාවිතයට ගත නොහැකි ලෙස මළබැඳී දිරාපත් ව තිබුණු අතර තොගයේ ආරක්ෂාව සම්බන්ධයෙන් පියවරක් ගෙන නොතිබුණි. තොගයේ නොපැවති කිරි පිහි 121ක් නිකුත් කිරීමට අදාළ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මිලදී ගනු ලැබු කිරිපිහිවලින් සමිති සඳහා සහ පුහුණු වැඩසටහන් සඳහා 2023 පෙබරවාරි 01 දින වන විට කිරිපිහි 1898ක් නිකුත් කර තිබුණද, භෞතික පරීක්ෂාවේදී තොග පොතෙහි නිකුත් කිරිම් අඩුවෙන් සටහන් වී තිබුනු නිසා නිවැරදි ශේෂයන් සොයා ගැනීමට නොහැකි වී ඇත. පසුව එය නිවැරදි කිරිමට කටයුතු කර ඇත. දැනට තොගය ආරක්ෂිතව ගබඩා කර තැබීමට කටයුතු නර ඇත. | කිරිපිහි ඌනතාවය පිළිබඳ පරික්ෂණයක් කළ යුතුය. ගබඩාවේ පවතින කිරිපිහි සමිති අතරේ බෙදාදිය යුතුය. |